# මීගමුව මහා නගර සභාව

## ප්‍රසම්පාදන දැන්වීමයි

මීගමුව මහා නගර සභාවට අයත් පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපෘතිය නිම කිරීම සඳහා සුදුසුකම්ලත් කොන්ත්‍රාත් ආයතන වෙතින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

**1) මිල ගණන් විස්තර**

I. මිල ගණන් ලියවිලි නිකුත් කිරීම - 2026.08.12 සිට 2026.09.02 දින ප.ව. 02.00 දක්වා
II. මිල ගණන් ලියවිලි භාර ගැනීම - 2026.09.03 ප.ව. 02.00 දක්වා
III. මිල ගණන් ලියවිලි විවෘත කිරීම - 2026.09.03 ප.ව.02.00 ට

**2) සුදුසුකම්**

i. උපලේඛනයේ පරිදි ඉදිකිරීම් හා සංවර්ධන පුහුණු ආයතනයේ (CIDA) අවම ලියාපදිංචි තිබිය යුතුය.
ii. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි CIDA ලියාපදිංචි පොතේ පිටපතක් ඇමිණිය යුතුය.

**3) මිල ගණන් ඉදිරිපත් කිරීම**

i. මිල ගණන් බහාලු කවරයේ වම්පස ඉහළින් ව්‍යාපෘතියේ නම සටහන් කළ යුතුය.
ii. මුල් පිටපත සහ අනු පිටපත වෙන වෙනම කවරවල බහා එම කවර නැවත එක් කවරයකට බහා මුද්‍රා තැබිය යුතුය.

4) මිල ගණන් ලියවිලි භාරගැනීම අවසන් කිරීමට නියමිත වේලාවට පෙර ලැබෙන සේ **"නාගරික කොමසාරිස් , මහා නගර සභාව, මීගමුව"** ලිපිනයට ලියාපදිංචි තැපැල් මඟින් හෝ ගෙනවිත් අංක 01ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක.

5) ඕනෑම මිල ගණන් ලියවිල්ලක් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මීගමුව මහා නගර සභාව සතුවේ.

6) මිල ගණන් ලියවිලි විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුට හෝ ටෙන්ඩර්කරුගේ ලිඛිත අවසරයලත් නියෝජිතයෙකුට පමණක් පෙනී සිටිය හැක.

7) ලංසු සුරක්ෂණය බැංකු ඇපකරයක් ලෙස හෝ සභාවේ මුදල් තැන්පත් කළ හැක. බැංකු ඇපකරය 2026.10.30 දින දක්වා වලංගු විය යුතුය.

❖ වැඩිමනත් විස්තර සඳහා නාගරික ඉංජිනේරු වෙතින් කාර්යාල වේලාවන් තුළදී පහත දුරකථන අංකය අමතා දැනගත හැකිය.

**දුරකථන අංකය - 031-2233190 / 031-2220053**

| අනු අංකය | ව්‍යාපෘතිය | CIDA ලියාපදිංචියේ අවම සීමාව | ලංසු ආකෘති පත්‍ර ගාස්තු (රු.) | ලංසු තැන්පත් මුදල (රු.) (2026.10.30 දක්වා වලංගු විය යුතුයි.) |
|---|---|---|---|---|
| 1 | 1 අදියර - 156 A උතුරු මුන්නක්කරය ග්‍රාම නිලධාරී වසමේ කුට්ටිදූව කරවල වාඩි වෙත පිවිසෙන සෙල්බි පාර ආරම්භයේ සිට (කොටුව පිට්ටනිය වටරවුම් පාරේ සිට) ඩබ්.එස්.පෙරේරා මහත්මියගේ වෙළඳසැල දක්වා (නො.38/1) මාර්ගය උස්සා කාපට් කර ශාන්ත අන්තෝනි මුනිඳුන්ගේ සුරුවම දක්වා කොන්ක්‍රීට් කාණුව ඉදි කිරීම. | C - 7 | 5,000.00<br>(vat 18%) 900.00<br>5,900.00 | 208,700.00 |
| 2 | 2 අදියර - 156 A උතුරු මුන්නක්කරය ග්‍රාම නිලධාරී වසමේ කුට්ටිදූව කරවල වාඩි වෙත පිවිසෙන සෙල්බි පාර අවසානයේ ඇති පාතිමා මණ්ඩපයේ සිට පාතිමා ක්‍රීඩා පිටියට යාබදව ඇති බෝක්කුව දක්වා කොන්ක්‍රීට් කාණුව ඉදි කිරීම හා සිඟිති මහත්මියගේ නිවස අසල සිට ජනක මහතාගේ නිවස දක්වා කොන්ක්‍රීට් කාණුව ඉදි කිරීම. | C - 9 | 5,000.00<br>(vat 18%) 900.00<br>5,900.00 | 31,800.00 |

| අනු අංකය | ව්‍යාපෘතිය | CIDA ලියාපදිංචියේ අවම සීමාව | ලංසු ආකෘති පත්‍ර ගාස්තු (රු.) | ලංසු තැන්පත් මුදල (රු.) (2026.10.30 දක්වා වලංගු විය යුතුයි.) |
|---|---|---|---|---|
| 3 | 163 තලාහේන ග්‍රාම නිලධාරි වසමේ සංචාරක නිකේතන බහුලව පිහිටා ඇති දෙස් විදෙස් සංචාරකයින්ගේ ගමනාගමනයට බාධා ඇති කරමින් නිරන්තරයෙන් ජලයෙන් යටවන ශ්‍රමදාන මාවත කොන්ක්‍රීට් කිරීම හා කාණු පද්ධතිය ඉදි කිරීම. | C - 8 | 5,000.00<br>(vat 18%) 900.00<br>5,900.00 | 75,500.00 |
| 4 | 156A උතුරු මුන්නක්කරය හා 158/A වැල්ලවීදිය ග්‍රා.නි.ව වලට මායිම් වන කාමච්චෝඩය දැනට පොළ පවත්වන ගොඩනැගිලි සංවර්ධනය කිරීම සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව පොළ භූමිය සංවර්ධනය කිරීම. | C - 7 | 5,000.00<br>(vat 18%) 900.00<br>5,900.00 | 279,800.00 |
| 5 | 72 ඒ නැගෙනහිර දළුපත සමනල ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම හා එම ක්‍රීඩාපිටිය ඉදිරිපිට මාර්ගයේ ඉදිරිපස සිට ඉදිරියෙන් ඇති පැරණි කාණුව දක්වා නව කාණුවක් ඉදි කිරීම. | C - 5 | 5,000.00<br>(vat 18%) 900.00<br>5,900.00 | 647,100.00 |
| 6 | මී.ප්‍රා.ලේ.කොට්ඨාසයේ 72/A දළුපත මෙතෝදිස්ත පාසල් මාවත කොන්ක්‍රීට් කිරීම. | C - 9 | 5,000.00<br>(vat 18%) 900.00<br>5,900.00 | 69,200.00 |

2026.08.12 දින මීගමුව මහ නගර සභාවේ,
ප්‍රධාන කාර්යාලයේදී.

ඩබ්.ඊ.ඩී. චාමර ප්‍රනාන්දු
නගරාධිපති
මහා නගර සභාව,
මීගමුව.